# 11 රණබිම අබියස

පාඨක රුචියත්, රසඥතාවත් වර්ධනය කරමින් සිංහල නවකතාව ජනප්‍රිය සාහිත්‍යාංගයක් බවට පත්කිරීමෙහි ලා පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ සුප්‍රකට නවකතාකරුවෙකු වන ඩබ්ලිව්.ඒ. සිල්වා සූරීන්ගේ විජයබා කොල්ලය නවකතාවෙන් උපුටා ගත් පරිච්ඡේදයක් මෙහි ඇතුළත් වේ. විජයබා කොල්ලය කෝට්ටේ රාජධානි සමය පසුබිම් කොටගෙන රචනා කොට ඇති ඓතිහාසික නවකතාවකි. නවකතාවට පසුබිම් කොටගත් යුගයේ දේශපාලන, සමාජ, ආර්ථික තොරතුරු මෙන් ම එවක ජීවත් වූ ඓතිහාසික පුද්ගල චරිත සජීවී ලෙස නිරූපණය කිරීමට උචිත භාෂා ශෛලියක් නිර්මාණය කර ගෙන තිබීම මෙහි දක්නට ලැබෙන විශේෂත්වයකි. නිර්මාණකරණයේ දී කතුවරයා යොදා ගෙන ඇති භාෂා රටා සම්ප්‍රදායයේ සුවිශේෂ ලක්ෂණ ඔබට හඳුනාගත හැකි ය.

නායක සෙනෙවි ස්වකීය වාස භවනයෙන් පිටත් වූ ගමන් අතරතුරක නො නැවතී, කෙළින් ම පැමිණියේ, වැලිකඩ යුද පෙරමුණට ය. සෙනෙවි රදුන් එන තෙක් එහි මග බලා සිටි සෙනෙවිවරු ඔහු දුටු කෙණෙහි, ඇතදී ම ගෞරවාදර පූර්වක ජය ඝෝෂයකින් පිළිගත්හ. මෙ දින, ඉතා වැදගත් දිනකි. විධායක මණ්ඩලයේ සියලු දෙන, සෙනෙවි රදුන් මෙන් ම තම තමන්ගේ නිලයට සුදුසු සම්පූර්ණ නිලාකාර වස්ත්‍රයෙන් සැරසී සිටියාහ. යුද්ධයෙන් දෙකින් එක ජය පරාජය දෙකින් එක නිශ්චය වන සටන, හෙට කෙරෙන්නේ ය. එය වෙනුවෙන් දත යුතු වුවදෙස්, අද සෙනෙවි රදුන් විසින් නියම කරනු ලැබේ. මේ නිලධාරීන් රැස්ව සිටින්නේ ඒ වුවදෙස් ලැබීමට ය.

නායක සෙනෙවි, සෙනෙවිවරුන්ගේ ද උපසෙනෙවිවරුන්ගේ ද, අවශේෂ විධායකයන්ගේ ද, මුහුණු පිළිවෙළින් බැලුවේ ය. ඔහුගේ පරීක්ෂණයට ඒ සියලු දෙනා දණ්ඩව්‍යූහයෙන් සිටියාහ. නයනානන්දයන් හා අසංගයන් එහි නො සිටි බවත්, ඒ වෙනුවට අනවශ්‍ය නිලධාරියකු සිටි බවත්, ඔහු දුටුවේ ය.

"මහන්තේ, මෙ තැන මට ඔබගෙන් වුවමනාවක් නැති. ඔබට රැක්ම බලපොකුණ ය" යි නායක සෙනෙවි ඒ අනවශ්‍ය නිලධාරියාට කීය.

තරුණ මහන්තේ රාලගේ මුහුණ කළු විය. ලජ්ජාව ඉවසා ගත නො හැකි වූ ලෙසින් ඔහු බිම බලාගත්තේ ය.

"මෙහි නො සිට දන් ම යනු. මා කී ලෙසින් බලපොකුණ මැනවින් රකිනු" යනුවෙන් නායක සෙනෙවි යළිත් කී ය.

මහන්තේ රාල තවත් එහි නො සිටියේ ය. පිරිවර සෙබළුන් කිහිපදෙන කැටුව

යන්නට පිටත් විය. එහෙත් ඒ අතර සභා මධ්‍යයට පැමිණි නයනානන්දයන් හා අසංගයෝ ඔහු විසින් දක්නා ලදහ.

"හූම්! මේ යන්නේ හොඳයි! හොඳයි! " යන්නක් ඔවුන් දුටු කෙණෙහි ඔහු කටින් නිකුත් වූයේ ය.

"අර මහන්තේ, නොවෙ ද? අර ගියේ?" කියමින් නයනානන්දයෝ අසංගයන් විතාළහ.

"ඒ යෝදයා මොකද මෙහේ? ඔහුට රැක්ම බලපොකුණ ය." යි අසංගයෝ ද කී හ.
ඉන් බොහෝ වේලාවකට පසු ඔවුන්ට මහන්තේ රාල ගැන සිහිපත් කරන ලද්දේ පිලැස්සේ බංඩාරයන් විසිනි.
"දුටුවෙ නැද්ද, සෙනෙවිරත්තුමා මහන්තේ රාල පන්නාගත් හැටි?" කියමින් පිලැස්සේ රාල විතාළේ ය. අනතුරු ව පිලැස්සේ රාල, නයනානන්දයන් හා අසංගයන්ගේ පැමිණීමට කලින් සිදු වූ දෙය ඔවුනට විස්තරයෙන් කීයේ ය.

"ඒ යෝදයා, මහ අහංකාර මිනිහා!" අසංග කී ය.

"අගමැති ඒකනායක මුදලි පොඩි මිනිහෙක්ද යි?" පිලැස්සේ රාල කී ය.

"එහෙනම් ඒ අහංකාරය ද මේ?" කියා නයනානන්ද සිනාසුණේ ය.

"ඔහුට කඳුරේ බංඩාරගේ පිහිටත් තිබෙනවා," යයි පිලැස්සේ රාල කී ය.

"එහෙනම්, මුළු රට ම ඔහුටයි." මේ කීවේ නයනානන්ද ය.

මේ අතර, නායක සෙනෙවියන් ප්‍රකාශයක් කරන ශබ්දය ඔවුනට ශ්‍රවණය විය. ඔවුහු ඊට ඇහුම්කන් දුන්හ.

"දරුවෙනි, දෙකින් එක බේරෙන්නේ අද හෙට කරන යුද්ධයෙන් තමා. අප අපගේ ජීවිත පුද කරන්නේ රජතුමා වෙනුවෙන් ම නො වේ. රටදැයසමය වෙනුවෙන් ද ජීවිත පරිත්‍යාග කළ යුතු ය. අප සතු ගම්බිම්දේපොළ හා වැපාර සියල්ල රට නම් වේ. උස් පහත්කමක, වෙනසක් නැති ව, සියලු කුලවල සිංහල සහෝදරසහෝදරියෝ දැය නම් වෙති. පරම්පරාගත ව පැවතෙන ආගම ප්‍රමුඛ බස හා සිරිත්විරිත් සියල්ල සමය නම් වේ. මේ සියල්ල රක්ෂාවන්නේ රජතුමා නිසා ය. රජතුමාට ප්‍රීතිය ඇති වන්නේ මේ සියල්ල ආරක්ෂා වන කල්හි ය. රජතුමාට පක්ෂපාති වීම රටටත්, දැයටත්, සමයටත් පක්ෂපාති වීම නම් වේ. මගේ මේ සෙනෙවි දරුවන් කෙරේ පමණක් නොව, සෙබළ දරුවන් කෙරේ ද, රටදැයසමය හා රජුට ද්‍රෝහි වන සිතක් නැති බව දනිමි. ඔත්පොළ ව සිටින හෙයින් රජතුමාට ද අද මෙහි පැමිණ යුද්ධය සංවිධානය අභිමත පරිදි කර ගත නො හැකි විය. මගෙන් අද මේ ප්‍රකාශ කෙරෙන්නේ, රජතුමාගේ නියමය බව සැලකුව

මනායි. දරුවෙනි, සිංහල සේනාව ලෙහෙසියෙන් ජය ගත හැකි යෝධකායක් නො වේ. අප මේ තාක් පසුබැස්සේ, සතුරා වඩා හොඳින් තුරුළට ගෙන, උණුසුම් කරන අදහසින් විනා, බැරිකමකින් නොවේ. දැන් ඉතින් ඔහු සුදුසු පමණට ළං වූ හෙයින් අපි ඔහුට කළ යුතු සංග්‍රහය කරමු. දරුවෙනි, මෙතෙක් මට සහාය වුණාක් මෙන් මේ කරන්නට යන සංග්‍රහයෙහි ද, සහාය වුව මැනවි. පරංගියා කෙරේ දුශ්චරිතය පමණක් නොව බොරුව ද, මොනවට ඇත්තේ ය. ඔවුන් අප ජය ගන්නට හදන්නේ, අල්ලසින් හා බොරු පොරොන්දුවලින් අප සෙන්පතියන් සිත්ගෙන, අප අතර අසමගිය ඇති කිරීමෙනි.

දරුවෙනි, ඔවුන් සටන් කරන්නේ, අපට යහපතක් කරන අදහසින් නො වේ. අපගේ හිසට අපගේ අත විනා පරංගියාගේ අතක් නොලැබේ. ඉදින්, ලැබෙතොත් එයින් රක්ෂාවරණය නොව, ලැබෙන්නේ ටොක්කකි. ඔවුන් මේ යුද්ධ කරන්නේ, කෙබඳු මතයකින් ද? අපගේ දරුවන් මරා, ස්ත්‍රීන් අනාථ කොට ධනය පැහැරගෙන රටක් අත්පත් කරගන්නා දෘඪ ලෝභයෙන් මත් ව, ඔවුහු සටන් කරති. අපි අපේ රටත්, සමයත් රජුත්, අඹුදරුවනුත්, ධනයත් රැක ගන්නා ස්වදේශානුරාගයෙන් මත් ව, සටන් කරමු. ඔවුන් පාලනය කරන නායකයා අන්ත දූෂකයෙකි. ඔවුන් ඒ නායකයා අනුගමනය කරන්නේ ඔහුගේ ගුණ ධර්මයන්හි පැහැදුණු ප්‍රේමයෙන් නොව, උදහසෙහි තැති ගැනුණු භීතියෙනි. අපි එසේ නො වෙමු. අපගේ රජුත්, රාජ්‍යයත් ආරක්ෂ කරන ශ්‍රද්ධා චිත්තයෙන් දිවි පුදන්නට අපි ඉදිරිපත් වෙමු. ඔවුහු දෘඪ ලෝභයෙනුත්, වධක චේතනාවෙනුත් මේ සටන කරන හෙයින්, තුමූ යනයන තැන කාල රාක්ෂසයා විසින් ලුහුබඳිනු ලබති. ඔවුන් කියන්නේ, අප ශිෂ්ටාචාර කිරීමට තමන් මෙහි පැමිණි බවයි. ඔවුන්ගේ ම අනුශාසක කුටිඤ්ඤෝ පියතුමාගෙන් ඊට සුදුසු පිළිතුරු ඔවුන් වෙත ලැබිණි. රාග-ද්වේෂමෝහ යන තුන් දොසින් කිපුණු සිත් ඇති ඔවුහු, අප තුළ කෙසේ නම් ප්‍රසාදයක් ඇති කරත් ද? ඔවුන්ගෙන් අපට රක්ෂාවරණයක් ලද හැකි නම් කැලේ සිටින වගවලසුන්ගෙන් ඊට වඩා හොඳ රක්ෂාවරණයක් ලද හැකියි. කොටින් ම අප විසින් සිහි කටයුතු මෙපමණකි. අපගේ රජතුමාගේ පිහිට මිස, අපට අන් පිහිටක් නැතියි. අපගේ සාමයික පිළිසරණ මිස අපට අන් පිළිසරණක් නැතියි. අපගේ රට මිස, අපට අන් රටක් නැතියි. එ හෙයින් ජීවිතයෙන් හෝ



පුදා මේ සියල්ල අප විසින් රැක්ක යුතු ය. ඉදින් දරුවෙනි, ඊට සූදානම් දැ?"යි නායක සෙනෙවි ප්‍රශ්න කළේ ය.

සියල්ලෝ ම ඊට සූදානම් බව එක හඬින් කියා සිටියාහ.

මේ අතර "පරංගි! පරංගි!" යනුවෙන් කෑ ගා ගෙන, එහි පැමිණි මුර සෙබළකු නිසා, සියල්ලෝ ම කලබල වූහ.

"පරංගි? ඒ කොයිබින් දැ?"යි නායක සෙනෙවි වහා ප්‍රශ්න කළේ ය.

"නාවල පැත්තේ-වෙල් යායෙන්-මහත් සේනාවකි- ස්වාමීනි, මහත් සේනාවකි," යනුවෙන් මුර සෙබළා හතිලමින් කී ය.

"දරුවෙනි, එසේ නම් කැඳවන්නටත් පළමු, සතුරා අප වෙත එන්නේ ය. දැන් ම සටන පටන් ගනිව්! පෙරමුණ රකින සෙන්පතිවරුන් ඒ ඒ පෙරමුණ සිට, පසු නො බැස, සටන් කළ යුතුයි. මෙ තැන් සිට, ගමන ඉදිරියට විනා, පසු බැසීමක් තවත් අපට නැති බව තරයේ සිතට ගත යුතු ය." යි ද නායක සෙනෙවි කීවේ ය.

නායක සෙනෙවියන්ගේ දේශනයෙන් සෙනෙවිවරු ද, උපසෙනෙවිවරු ද, විධායකයෝ ද, එක සේ ප්‍රෝත්සාහි වූහ. එක සේ කුල්මත් වූහ. සතුරන් සිටින තැන් සොයා ගෙන, යන්නට තරම් නව පණ ලත් මේ මොහොතේ දී සතුරන් තමන් සොයා එන වග ඔවුනට සැල වීම ප්‍රීතියට කාරණයකි. අද යුද්ධයෙන් නම් දෙකින් එක විය යුතු ය. ජය විනා පරාජය දකින්නට කිසිවකු ජීවත් නොවන තැනට ඔවුහු සිතා ගත්හ. එ හෙයින් මේ විධායක මණ්ඩලය විසිර යන විට සමහරු ඔවුනොවුන් නැවත දකින බලාපොරොත්තු නැති හෙයින් ආචාර සමාචාර පැවැත්වූහ. ඉතා හිතවත් සමහරු, ඔවුනොවුන් වැළඳගත්හ. තවත් සමහරු ජීවත්වන්නා විසින් මළ ගිය තැනැත්තාගේ අඹු දරුවන් හා දේපොළ වෙනුවෙන් කටයුතු සඳහන් කළහ. මේ සියල්ල විනාඩි කීපයකින් අවසන් කර දමා, කවුරුත් වහවහා යුද පෙරමුණු බලා පිටත් වූහ.

නායක සෙනෙවි පිටත් ව යන්නට පළමු නයනානන්දයන් හා අසංගයන් තමන් වෙත කැඳවා, "දරුවෙනි, ඔබ දෙ පොළගේ තරම් මම මැනවින් හඳුනමි. නයනානන්දයෙනි, වැලිකඩ පෙරමුණ, උතුර, තොප විසින් රැක්ක යුතු ය. එහි බටහිර, තොප විසින් රැක්ක යුතු ය." යි අසංගයනට ද පවසා, යළි, "මම සතුරාට අභිමුඛ ව ඉදිරියට ම යන්නෙමි. මාගේ රටත්, ජාතියත්, රජුත්, මේ උපද්‍රවයෙන් මිදෙන තෙක් මම ඉදිරියට ම ගමන් කරන්නෙමි. මට ජය නො වෙතොත්, මරණය හෝ වේවා! රටත්, රජුත්, සමයයත් යන්න අප හැමට ම සමර ගීතය වේවා!" යි කීයේ ය.

මේ තරුණ සෙනෙවියෝ දෙදෙනා මුවෙන් නොබැණ සිටියාහ. එහෙත් ඔවුන්ගේ විලාසය මුවෙන් දොඩන බසට ද වඩා ව්‍යක්ත විය.

"ඉතින් අපි ද මෙ තැනින් වෙන් වෙමු ය," යි සෙනෙවි රදුන් නික්ම ගිය ඇසිල්ලේ, අසංග, නයනානන්දයනට කී ය. "ජය පානය පිණිස නැවත එක් වෙන්නට වෙන්වෙමු," යි ද කීයේ ය.

"අසංගයෙනි, මේ අප යන්නේ, නො එන ගමන් විය හැකි යි. එ හෙයින් ඔබට එක් වචනයක් කියනු කැමැත්තෙමැ යි," නයනානන්දයෝ කීහ.

"දැන්, තුඩතුඩ පවතින අප එක ම වචනය යුද්ධය! යුද්ධය! යුද්ධය! යි," අසංගයෝ කීහ.

"ඒ ඇත්තකි" යනුවෙන් නයනානන්දයෝ ද දෙතොල් තද කර ගෙන, මඳක් කල් සිට, "තවත්තවත් එකක්නීලමණි විතරක් මතක් කරනු කැමැත්තෙමැ යි" කීහ.

"නීලමණි? ඔහ්! " යනුවෙන් අසංගයෝ ද විස්මය ප්‍රකාශක රාවයක් නිකුත් කොට, බලා සිටියාහ.

නයනානන්දයෝ "තවත් පැයකින් අපට" කියා නිශ්ශබ්ද වූහ.

"තවත් පැයකින් අපට මරණයනැත්නම් ජය" අසංගයෝ කීහ.

"එකකුට මරණයත් එකකුට ජයත් වුණොත්?" කියා නයනානන්දයෝ කීහ.

"දෙදෙනාට ම මරණය විය හැකියි," අසංගයෝ කීහ.

"එසේ නම් මාගේ නීලමණි කුමරියට සිව්වරම් දෙවියන් පිහිටයි. අසංගයෙනි, මා ඇවෑමෙන් ඔබ ජීවත් වන්නෙහි නම්, නීලමණිය ආරක්ෂා කරන බවට ප්‍රතිඥා කළ මැනවැ යි" ඔහු කීවේ ය.

"කෙසේ ද?"

"කලින් අදහස් කළ ලෙස"

"නයනානන්දයෙනි, ඔබගේ මේ හීන වීර්යය භයානක ය- හා! හා! ඔය බෙලසුලු බොළඳකම් දුර ගසා දමා, පුරුෂ ධෛර්යය වඩනු"

නයනානන්දයන්ගේ මුහුණ සිව්මැලි තරුණියකගේ මෙන් සුදුමැලි විය ලජ්ජාවෙන් සුදුමැලි විය. අසංගයන් තමා තේරුම් නො ගත් බව ඔහු දුටුවේ ය. අසංගයන් නො දනිතත් නීලමණිය තුළ අසංගයන් වෙනුවෙන් පෙර පැවැති සෙනෙහස ගැන ද, දැන් පවතින බුහුමන ගැන ද, ඔහු දන්නේ ය. සෙනෙවි කුමරිය, අසංගයන් සිය සිතින් බැහැර කළේ නොමනාපයකින් නොව, වැඩි සෙනෙහස නිසා තමනට හද මැදුර ඉඩ දිය යුතු හෙයිනි. ඉදින් තමන් ඇවෑමෙන් අසංගයන් වෙත යළිත් ඇය සිත අවනත වන කල, කලින් කළ නිග්‍රහයට සුදුසු පළිය ඇයගෙන් ගන්නට ඔහු සිතුවහොත් නපුරැයි නයනානන්දයෝ සිතූහ.

"අසංගයෙනි, මගේ ඉල්ලීම නිවටයකුගේ නිවට කමක් ලෙස ගෙන, කවටකම් නො කරනු. මම නීලමණිය ඔබ වෙතින් පැහැර ගත්තෙමි. ඇය මා පිළිගත්තේ, ඔබට ඇති නොකැමැත්තක් නිසා නොව, මට ඇති වැඩි කැමැත්ත නිසා ය. මගේ ඇවෑමෙන් ඔබ ඇයගෙන් පළිගන්නට නොසිතා ඇයට රක්ෂාවරණය දෙන බවට"

"සෙනෙවිතුමනි" කියමින් මෙහි දී අසංග ඔහු නතරකොට, "ඔබගේ මේ නිවටකම සටන පිළිබඳ නොව ගැහැනියක පිළිබඳ බව මම දනිමි. එය සැනසීමකි. ඉදින් නීලමණිය කැමති නම්, මගේ නොකැමැත්තක් නැත යි," කීයේ ය.

"අසංගයෙනි, මා නැසුණු කල, මා කී මෙ පවත් ඇයට කියනු ඔබට මා කිව් අන්තිම වචනය ද, එය ම බව කියනු මැනවැ යි" ඔහු යළිත් කීයේ ය.


අසංගයෝ ඒ පිළිගත්හ. ඒ පිළිගත් බවට ඔහුගේ අවංක මුහුණ ස්ථිර සාක්ෂ්‍යයකි. නයනානන්දයෝ එපමණකින් සැනසුණාහ. සැහැල්ලු සිතින් ඔහු ජවාධිකයා පිට පැන නැඟී, "සැරද සෙනෙවි තුමනි" යන්න කියා ගෙන, පිටත් ව ගියේ ය.

"සැරද! සැරද!" යන පිළිතුරු බසින් අසංගයෝ ද සමාචාර පවත්වා සිය තුරඟ වාහනයෙන් යුද පෙරමුණ බලා පිටත් වූ හ.

**අරුත් පැහැදිලි කිරීම**

| | | |
|---|---|---|
| අභිමත | - | කැමති |
| අභිමුඛ ව | - | මුහුණ ලා |
| උදහස | - | කෝපය |
| උපද්‍රවයෙන් | - | උවදුරින් |
| කාල රාක්ෂසයා | - | කාලය නමැති රකුසා (මරණය) |
| ජන්ම ලාභය | - | උපත |
| දණ්ඩව්‍යුහයෙන් | | සීරුවෙන් |
| දෘඩ ලෝභයෙන් | | දැඩි ආශාවෙන් |
| ප්‍රසාදයක් | | පැහැදීමක් |
| ප්‍රෝත්සාහී | | වඩාත් උත්සාහවත් |
| බුහුමන | | බහුමානය, ගෞරවය |
| බෙලසුලු | | බියගුලු |
| සමර ගීතය | - | රණ ගීය |

## ක්‍රියාකාරකම 01



**පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) නායක සෙනෙවි තම හමුදාවේ මානසික ශක්තිය වර්ධනය කරමින් ජයග්‍රහණය කරා යොමු කිරීමෙහි ශූර, අභීත සෙන්පතියෙකු වූ බව පාඩම ඇසුරින් පෙන්වා දෙන්න.

(ii) පරංගීන්ට එරෙහි ව සටන් කිරීම සඳහා සිංහලයන්ට තිබූ සාධාරණ හේතු මොනවා ද?

(iii) පරංගීන් සිංහලයන්ගේ බලය බිඳීම සඳහා යොදා ගත් උපක්‍රම හඳුන්වන්න.

(iv) අසංග හා නයනානන්ද අතර සිදුවන සංවාදයෙන් නීලමණී පිළිබඳ ව හෙළිවන තොරතුරු සැකෙවින් දක්වන්න.

**පහත දැක්වෙන යෙදුම්වල අරුත් පැහැදිලි කරන්න.**

(i) ස්වකීය වාස භවනයෙන්.

(ii) ගෞරවාදර පූර්වක ජය ඝෝෂයකින්.

(iii) නිලයට සුදුසු සම්පූර්ණ නිලාකාර වස්ත්‍රයෙන් සැරසී
(iv) අවශේෂ විධායකයන්ගේ
(v) සියලු දෙනා දණ්ඩව්‍යූහයෙන් සිටියාහ.
(vi) යුද්ධ සංවිධානය අභිමත පරිදි කර ගත නො හැකි විය.
(vii) දෑඩි ලෝභයෙනුත්, වධක චේතනාවෙනුත්
(viii) උදහසෙහි තැති ගැනුණු භීතියෙනි.
(ix) එක සේ ප්‍රෝත්සාහී වූහ.
(x) මම සතුරාට අභිමුඛ ව ඉදිරියට යමි.

## ක්‍රියාකාරකම 02

**වාක්‍ය නිර්මාණයේ දී උක්තාඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි ලෙස භාවිත කළ යුතු ආකාරය පහළ ශ්‍රේණිවල දී ඔබ ඉගෙන ගෙන ඇත. තවත් එබඳු වාක්‍ය රීති කිහිපයක් පහත දැක්වේ.**

(i) **අප්‍රාණවාචී බහුවචන උක්තය සහිත වාක්‍ය**

(අ) අප්‍රාණවාචී බහුවචන නාම පදයක් උක්තය ලෙස යෙදෙන වාක්‍යයක ආඛ්‍යාතය ඒකවචනයෙන් යෙදෙයි.

උදා : **සිවු මහා නදී සමනොළ මුදුනින් ඇරඹෙයි.**
**සුදු වලා අහසේ පාවෙයි.**

(ආ) අප්‍රාණවාචී නාම පදයකට ප්‍රාණවාචී ඕ හු යන බහුවචන ප්‍රත්‍යය ගැන්වූ විට ආඛ්‍යාතය බහු වචනයෙන් යෙදේ.

උදා : **සිවු මහා නදීහු සමනොළ මුදුනින් ඇරඹෙති.**
**සුදු වලාවෝ අහසේ පාවෙති.**

කණ්ඩායම්වලට බෙදී අප්‍රාණවාචී පද දහය බැගින් සොයා ඉහත සඳහන් 'අ' 'ආ' කොටස්වල රීති අනුව වාක්‍යවල යොදන්න.

(ii) **ගෞරවාර්ථය හඟවන උක්තය සහිත වාක්‍ය.**

(අ) උක්තය ඒකවචන වුවත් ගෞරවාර්ථ ඕ, හු ප්‍රත්‍යය ගැන් වූවිට ආඛ්‍යාතය බහුවචනයෙන් යෙදේ.

උදා : **රජ්ජුරුවෝ දැහැමින් රට පාලනය කරති.**
**මහෞෂධ පණ්ඩිතයෝ නුවණින් සතුරන් දිනූහ.**
**කුමරතුඟුහු මහ වියරණ ගතක් කළහ.**

(ආ) **ආණ, අණු, අණි** ගෞරවාර්ථ ප්‍රත්‍යය යෙදෙන නාම පද උක්ත වූ විට ආඛ්‍යාතය බහුවචන වේ. ආණ, අණු පුරුෂ ලිංගයෙහි ද අණි ස්ත්‍රී ලිංගයෙහි ද යෙදේ.

උදා : **පියාණෝ සෙනෙහසින් දරුවන් රකිති.**
**පුතණුවෝ මැනවින් ශිල්ප හදාරති.**
**දුවණියෝ කුලසිරිත් රකිති.**

කණ්ඩායම්වලට බෙදී ගෞරවාර්ථය හඟවන වෙනත් උක්ත පද සොයා වාක්‍යවල යොදන්න.

## ක්‍රියාකාරකම 03

**පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල යෙදෙන්න**

(අ) පහත දැක්වෙන අප්‍රාණවාචී නාම පද සුදුසු පරිදි "ඕ, හු" ප්‍රත්‍යය ගන්වා වාක්‍යවල යොදන්න.

i. සමර ගීතය ii. උපද්‍රව iii. තාරකා iv. රීති v. වනස්පති

(ආ) "නයනානන්දයෝ අසංගයන් විතාළහ."
"අසංගයෝ ඔහු විසින් දක්නා ලදහ." යන පාඨමෙහි යෙදී ඇති වාක්‍ය අනුව යමින් වාක්‍ය පහක් ලියන්න.

(ඇ) පහත දැක්වෙන නාම පදවලට "ආණ, අණු, අණි" යන ගෞරවාර්ථ ප්‍රත්‍යය සුදුසු පරිදි යොදා ඒවා උක්ත වන සේ වාක්‍යවල යොදන්න.

| | |
|---|---|
| **සිටු** | ඇදුරු |
| **කවි** | **මල්** |
| **මිත්‍ර** | **මයිල්** |
| **වෙළෙඳ** | **තෙර** |

## ක්‍රියාකාරකම 04

(i) පන්තියේ සියලු දෙනා එක් ව **"ඩබ්.ඒ. සිල්වා සූරීන්ගේ සාහිත්‍ය සේවාව"** තේමා කරගෙන බිත්ති පුවත්පතක් නිර්මාණය කරන්න.

(ii) ඓතිහාසික සිද්ධි ආශ්‍රයෙන් නිර්මාණය කරන ලද වෙනත් සිංහල නවකතා හා කතුවරුන් නම් කරමින් වගුවක් පිළියෙල කරන්න.